**ජාතික විද්‍යා පදනම - 2015**

---------------------------------

ජාතික විද්‍යා පදනමේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1994 අංක 11 දරන විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතේ 40 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර පදනමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක වාර්තාවක් පදනමේ සභාපති වෙත යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------------**

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**--------------------------**

ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**-------------------------**

1974-1998 දක්වා කාලය තුළ පර්යේෂණ කටයුතු වෙනුවෙන් අත්පත්කර ගන්නා ලද පිරිවැය රු.5,004,108 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ විද්‍යාත්මක හා පරීක්ෂණාගාර උපකරණ අදාල පර්යේෂණ ආයතනවලට පවරාදී ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනවලින් එහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**------------------------**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

**-----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,031,986ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,763,678 ක් විය. ඉකුත් වර්ෂය සමග සැසදීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,795,664 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් රු.13,911,072කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 දායකත්වය**

**---------------**

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 හා 2014 වර්ෂ තුළදී මූල්‍ය ප්‍රතිඵලයෙහි අතිරික්තයක් ලබා තිබුණද සමාලෝචිත වර්ෂයේ සහ 2011, 2012 වර්ෂවලදී ඌනතාවයක් ලබා තිබුණි. එසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේදී පදනමේ දායකත්වය 2011 වර්ෂයේ දී රු. 53,822,305 ක්වූ අතර 2015 වර්ෂය වන විට එය රු. 91,510,109ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කාර්යසාධනය**

(අ) 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනතේ 10 වගන්තිය ප්‍රකාරව ජාතික විද්‍යා පදනමේ කර්තව්‍යයන් පහත දැක්වේ.

(i) විද්‍යාත්මක පර්යේෂණ ශක්‍යතා ශක්තිමත් කිරීම, ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත් සංවර්ධනය කිරීම, ශ්‍රී ලංකා ජනතාවගේ ශුභ සාධනය ප්‍රවර්ධනය කිරීම සහ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් පර්යේෂණ පුහුණු කිරීමේ අදහසින් විශ්වවිද්‍යාල, විද්‍යා හා තාක්ෂණ ආයතන හා විද්‍යාඥයන් විසින් පර්යේෂණ ආරම්භ කිරීම පහසු කිරීම සඳහා සහාය වීම.

(ii) දේශීය හා විදේශීය විද්‍යාඥයින් අතර තොරතුරු හුවමාරු කර ගැනීම ධෛර්යමත් කිරීම.

(iii) විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව පිරිනැමීම.

(iv) විද්‍යා හා කාර්මික පිරිස් පිළිබඳ ප්‍රවර්තන ලේඛනයක් පවත්වාගෙන යාම.

(v) ජනතාව අතර විද්‍යාව ජනප්‍රිය කිරීමේ කාර්ය සඳහා වැඩසටහන්වලට අරමුදල් යෙදවීමෙන් විද්‍යාව ජනප්‍රිය කිරීම.

(ආ) ඉහත කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේ දී 2010-2015 කාලපරිච්ඡේදය තුළ නිම කරන ලද වටිනාකම රු.189,302,839 ක්වූ පර්යේෂණ ව්‍යාපෘති 150ක් වූ අතර ඒ සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) නිමකර ඇති පර්යේෂණ ව්‍යාපෘති 150කින් (වාණිජකරණය කිරීම සඳහා වැඩිදියුණු කිරීම ) රු.3,049,000 ක් වටිනා ව්‍යාපෘති 02ක් තාක්ෂණ පැවැරීම් ලබාදීම සඳහා ද රු.1,782,200 ක් වටිනා ව්‍යාපෘති 02ක් පේටන්ට් ලබාගැනීම සඳහා පමණක් යොමුකර තිබුණි.

(ii) වටිනාකම රු.184,471,639 ක්වූ ඉතිරි පර්යේෂණ ව්‍යාපෘති 146 හි පර්යේෂණවල අවසන් ප්‍රතිඵලය ලෙස දේශීය හා විදේශීය විද්‍යාත්මක ප්‍රකාශන පල කිරීම, සන්නිවේදන සඳහා යොදා ගැනීම, පශ්චාත් දර්ශනපති, දර්ශනශූරී උපාධි සඳහා යොදාගැනීම සහ ජනාධිපති සම්මාන සඳහා නිර්දේශ වීම යන අරමුණු පමණක් ඉටුකර ගෙන තිබුණි.

(iii) නිමකළ පර්යේෂණ ව්‍යාපෘති 150 අතරින් පර්යේෂණ 59ක් දේශීය ප්‍රකාශන මට්ටමේද, පර්යේෂණ 27ක් ජාත්‍යන්තර ප්‍රකාශන මට්ටමේද, පර්යේෂණ 37ක් සන්නිවේදන මට්ටමේද, වූ අතර පර්යේෂණ 27ක් සඳහා කිසිදු ප්‍රකාශනයක් සිදුකර නොතිබුණි.

(iv) 2011 වර්ෂයට පෙර ආරම්භ කරන ලද පර්යේෂණවලට අදාලව පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය නිම කර මාස 06ක් ඇතුළත අවසාන ප්‍රගති වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් 2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය

තුළදී නිම කළ පිරිවැය රු.32,024,274 ක්වූ පර්යේෂණ ව්‍යාපෘති 33කට අදාල අවසාන වාර්තාව නිකුත් කිරීමේදී අවුරුදු 01 සිට අවුරුදු 04 දක්වා කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ඇ) පර්යේෂණ කටයුතු නිම කිරීමට උපරිම වශයෙන් වසර 03ක කාලයක් ලබාදී තිබුණ ද විශේෂිත අවස්ථාවන් හීදී එම කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද 2011 හා 2012 වර්ෂවලදී රු.64,565,489 ක් වැය කර ආරම්භ කළ පර්යේෂණ 33ක් සඳහා 2016 ජනවාරි වන විට ලබා දී තිබු අමතර කාලය අවසන් වී මාස 3ත් අවුරුදු 1ත් අතර කාලයක් ගතවී තිබුණ ද පර්යේෂණ අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**--------------------------------**

ව්‍යාපෘති ගිවිසුම අනුව පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලබාදුන් ප්‍රදානයන්ගෙන් පර්යේෂණ අවසන් වූ විට ඉතිරි මුදලක් වේ නම් දින 30ක් ඇතුළත පියවිය යුතු වුවත් 2007 වර්ෂයේ සිට 2013 කාලපරිච්ඡේදයට අදාලව දෙන ලද ප්‍රදානයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී අවසන් කරන ලද ව්‍යාපෘති 28කින් ලැබිය යුතු රු.5,255,529ක ශේෂය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම පියවා නොතිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.6,112,676ක් වූ දේශීය හා විදේශීය බැංකු ගිණුම් 04 ක ශේෂ ඌන උපයෝජිතව පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**------------------------------------------**

**5.1. ප්‍රසම්පාදන සැලැස්ම**

**-------------------------**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (අ) වගන්තියට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමේ අරමුණ වන්නේ ප්‍රසම්පාදනයන් නියමිත කාලය තුළ අවසන් කරන බවට සහතික වීම වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.94,282,000 ක්වූ සැලසුම් කරන ලද ප්‍රසම්පාදන කාර්යයන්ගෙන් ක්‍රියාත්මක නොකරන ලද ප්‍රසම්පාදන කාර්යයන්ගේ ඇස්තමේන්තුගත වටිනාකම රු. 78,445,000ක් විය.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවයේ නියුතු නිලධාරින්ගේ විදේශ ගමන් වියදම් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් පුනරාවර්තන වියදම් යටතේ ප්‍රතිපාදන වෙන්කර නොතිබියදී සමාලෝචිත වර්ෂය තුළදී විදේශ ගමන් වාරිකා ප්‍රදාන සඳහා වූ ප්‍රාග්ධන වැය විෂයයෙන් රු.4,343,428 ක් වැයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පර්යේෂණ හා විද්‍යාත්මක වැඩ කටයුතු වෙනුවෙන් සංශෝධිත අයවැය ලේඛනයෙන් රු. 15,000,000 ක අමතර ප්‍රතිපාදන වෙන්කර ගැනීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් සම්බන්ධයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර පදනමේ සභාපති වෙත යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) පර්යේෂණ ප්‍රදාන ලබා දීම සහ අධීක්ෂණය | (i) අයදුම්පත් ඇගයීම්වලට අදාල ලේඛන, පර්යේෂණ ශිෂ්‍යයින් හා තාක්ෂණ සහයකයින් බඳවා ගැනීමට අදාල ලිපි සහ ප්‍රගති වාර්තා ඇගයීම් කටයුතුවලට අදාල තොරතුරු ඇතුළත් කර පර්යේෂණ ලිපිගොනු යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබීම. |
| | (ii) පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ මූල්‍ය වාර්තා ප්‍රමාද වී ලබා ගැනීම සහ ප්‍රදාන ලෙජරය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| | (iii) අවසන් වූ පර්යේෂණවල ඉතිරි මුදල් පවරා ගැනීමේදී ප්‍රමාදයන් පැවතීම. |
| (ආ) විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන වෙත ලබා දී ඇති උපකරණ ප්‍රදාන | (i) උපකරණ මිලදී ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත වීම සහ මිලදී ගනු ලැබූ උපකරණ පිළිබඳ භෞතික පරීක්ෂාවන් සිදුකර පැවැත්ම තහවුරු කර ගෙන නොතිබීම. |
| | (ii) වාර්ෂික ප්‍රගති වාර්තා නිසි වෙලාවට ලබා නොගැනීම. |
| | (iii) උපකරණ ප්‍රදානය කළ ආයතනයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ පිටපතක්, භාණ්ඩ ලැබීම් පත්‍රයේ පිටපතක් සහ වසර දෙකක නඩත්තු ගිවිසුමේ පිටපතක් කඩිනමින් ලබාගෙන පැවැත්ම තහවුරු කර නොගැනීම. |
| (ඇ) තාක්ෂණ පැවරීම් ලබාදීම | වාර්ෂික වියදම් වාර්තා නියමිත කාලපරිච්ඡේදය තුලදී ලබාගෙන අදාල ප්‍රදාන ලෙජරය යාවත්කාලීන නොකිරීම. |